# අසනි

සමාජවාදී එක්සත් ලංකාවක් උදෙසා පළවන පුවත් පත

2023 සැප්-ඔක්
52 වන කලාපය.
රු. 50/=

පුවත්පතක් වශයෙන් ලියාපදිංචි කරන ලදි


ධනපති පංතියට
විකල්පය ලෙස
**වාමාංශික පෙරමුණ**
**ගොඩනගමු..!**

# වයසනයට එරෙහි දැවැන්ත ජනතා විරෝධයක්!





**ණය බර දෙගුණයකින් වැඩිවී ඇති බව පසුගිය මාසයේ වාර්තා වී තිබුණි. එය ඩොලර් බිලියන 91.561 දක්වා වැඩි වී ඇති බව ලෝක බැංකු වාර්ථාවල සඳහන් වීය. මේ අතර නාස්තිය දූෂණය සොරකම වැඩිවෙමින් තිබේ. එය වැළැක්වීමට පලකයින්ගන්නා උත්සාහය  අසාර්ථක වී ඇති බව පෙනේ.**

**දරිද්‍රතාව (දිළිදුකම) දෙගුණයකින් වැඩිවී තිබිම යනු 13.1% ව තිබූ දරිද්‍රතාව 25% දකිවා වැඩිවීමක් බව පුරෝකථනය කර තිබුණි. එය ඉදිරි වර්ෂය දක්වා පවතින බවද සඳහන් කර තිබේ.**

**ඉහත සඳහන් තත්ත්වය හමුවේ මතුවන සමාජ පිඩනය තවත් උග්‍ර වන්නේ සෞඛ්‍ය ක්ෂේත්‍රය කඩා වැටීම, වැඩකරන ජනතාවගේ EPF-ETFඅරමුදල් උදුරා ගැනීමට පාලකයින් කරන කුමන්ත්‍රණයද, දුගී ජනතාවට ලබා දෙන දිළිදු සහනාධාර කප්පාදු කිරීමද රාජ්‍ය සේවය පෞද්ගලිකරණය කිරීම නිසා ඇතිවන සාමාජ ව්‍යසනය අතිශය උග්‍රවනු ඇත. මෙමගින් ගොඩ නැගෙන ජනතා විරෝධය මර්දනය කිරීමට පාලකයින් අනුගමනය කරන ක්‍රියා පිළිවෙත ඔවුනට පාරාවළල්ලක් වීම වැළැක්විය නොහැකිය.**

## ණය ට්‍රිලියන 2 යි..! වියදම ට්‍රිලියන 8 යි..!

මේ වන විට විවිධ ව්‍යාපෘති සඳහා රුපියල් ට්‍රිලියන 8ක මුදලක් වෙන් කර ඇතත් වියදම් කර තිබෙන්නේ රුපියල් ට්‍රිලියන 2ක් බව විගණකාධිපති පවසා තිබේ. මෙලෙස ණය ලබා ගෙන කරන සියයට 75ක මුදල දූෂණයට ලක් වෙමින් තිබෙන අතර පාලකයින්ට මේ පිළිබඳව මුනිවත රකිමින් සිටින බව පෙනේ.■

## ජනතාවට මරු කැඳවන සෞඛ්‍ය සේවය..!



ඉතිහාසයේ දරුණුතම අර්බුදයකට මුහුණ දෙමින් තිබෙන සෞඛ්‍ය සේවය නැවත යාථාවත් කිරීමට පාලකයින්ට නොහැකි බව පෙනී ගොස් තිබේ. ඖෂධ හිඟය බාල බෙහෙත් ගෙන්වීම එන්නත් විෂ වී රෝගීන් මියයාම නුවරඑළිය රෝහලේ ඇස් අන්ධ වූවන් ගැන වාර්තා සමඟ වෛද්‍යවරුන් රට හැර යාම වැනි බරපතල ගැටළු නිසා මුළු සෞඛ්‍ය සේවයම කඩා වැටීමේ අනතුරක් දක්නට ලැබේ.

මෙවන් පසුබිමක් තුළ සැප්තැම්බර් 8 වනිදා සෞඛ්‍ය ඇමති වරයාට විරුද්ධව ගෙන එන ලද විශ්වාස භංගය පරාජය කිරීමට පාලකයින් කටයුතු කරනු ලැබුවත් රට පුරා ගොඩනැගෙන විරෝධය වැළැකිවීමට ඔවුන්ට නොහැකි වනු ඇත. එකී ජනතා විරෝධය හමුවේ ගොඩනැගෙන විශ්වාස භංගය පරාජය කිරීමට නම් පාලකයින්ට නොහැකි වනු ඇත.■

## චැනල් 4 වීඩියෝවේ ඇත්ත නැත්ත හෙළිකරනු !

චැනල් ෆෝ වීඩියෝව එළිදැක්වීමත් සමඟ රාජපක්ෂ පවුලට තිබු විරෝධය තවත් වැඩිවෙමින් තිබේ. පාස්කු ප්‍රහාරයේ මහා මොලකරු සොයන ලෙස පසුගිය වසර කිහිපය තුළ පාලකයින්ට බලපෑම් එල්ලවෙමින් තිබුණි. මෙම හෙළිදරව්වත් සමඟ දෙබරයකට ගලක් ගැසුවා වැනි තත්ත්වයක් මතු වී තිබේ. රාජපක්ෂලා බලයට ඒම සඳහා මෙවන් ලේ වැගිරීමක් කළා නම් ඔවුනට ජීවිතයේ අවසාන කාලය ගෙවන්නට වන්නේ සිරමැදිරිවලය. එකී විනාශකාරී මරණීය වරදකට කිසිඳු සමාජයක් ඉඩ නොදෙනු ඇත. මෙම ම්ලේච්ඡ ඝාතනය සොයා බැලීමේ ප්‍රධාන වගකිම ඇත්තේ වත්මන් ජනාධිපතිවරයාට බැවින් තවදුරටත් රාජපක්ෂලා ආරක්ෂා නොකර ස්වාධීන පරීක්ෂණයක් ආරම්භ කරමින් මෙහි සත්‍ය අසත්‍යතාව හෙළිදරව් කරන ලෙස ශ්‍රී ලංකාවේ සමාජවාදී පක්ෂයේ ප්‍රධාන ලේකම් මහින්ද දේවගේ සහෝදරයා මාධ්‍යට ප්‍රකාශයක් කරමින් ඉල්ලා සිටී.■

# 1953 හර්තාලය සහ 2022 අරගලය

1953 හර්තාලයට මෙම මාසය වන විට වසර 70 ක් සපිරේ. ධනපති පාලනයට එරෙහි මෙම සියවසේ ඉතිහාසයට එකතු වූ පළමු බහුජන අරගලය ලෙස එය හැඳින්වීමට හැකිවේ. ඊට පසු දශකවල උතුරේ සහ දකුණේ කැරලිවලට බහු ජනතාවගේ අනුකූලත්වයක් ලබා ගැනීමට නොහැකි විය. මේ අරගල හා කැරලිකාරී නැගිටීම් පිළිබඳ විවිධ විග්‍රයන් තිබේ. මේ පිළිබඳව සාකච්ඡා කිරීම මෙකී ලිපියේ අරමුණ නොවේ. 53 ඇති වූ ජනතා නැගිටීම හා 2022 අරගලය අතර විවිධ වෙනස්කම් තිබේ. 53 හර්තාලය ලංකා සමසමාජ පක්ෂයේ මූලිකත්වයෙන් ආරම්භ වූවකි. එවකට පැවති සියළු විපක්ෂ බලවේගයන්ගේ සහයෝගය ලබාගැනීමට





සමසමාජ නායකත්වය දක්ෂ විය. මේ වන විට පැවති එ.ජා.ප ආණ්ඩුව විසින් ශත 25 ට තිබු හාල් සේරුව ශත 75 දක්වා වැඩි කිරීම ඇතුළු විවිධ සුභ සාධන සේවා කප්පාදු කිරීම් වලට එරෙහිව එම හර්තාලය සංවිධානය කරන ලදි. 53 අගෝස්තු 11 සහ 12 යන දින ජාතික විරෝධතාවයක් ලෙස හර්තාලය ආරම්භ කිරීමට තීරණය කරන ලදි. මහා වැඩ වර්ජනයකින් ආරම්භ වු විරෝධතාවයට ලංකාවේ බොහෝ ප්‍රදේශවල ජනතාවගේ සහයෝගය ලබා ගැනීමට හැකිවිණ. වීදි පුරා පෙල පාලි හා උද්ඝෝෂණ පවත්වමින් ජනතාව පෙරට පැමිණියේ ය. ගාලු පාර අවහිර කරමින් කාන්තාවන් ආප්ප පිළිස්සීම වැනි ක්‍රියාමගින් මෙම ජනතා නැගීමට එකතු විය. මේ ඇති වූ දැවැන්ත විරෝධයේ ප්‍රථිඵලයක් ලෙස එවකට අගමැතිවරයා ලෙස සිටි ඩඩ්ලි සේනානායක කැබිනට් මණ්ඩලය රැස්වීමට තෝරා ගත්තේ මුහුදේ නවත්වා තිබූ ඇමෙරිකානු එලිසෙබත් මවුන්ටන් නමැති නැවකි.  මේ ඇති වූ දැවැන්ත සමාජ බලපෑම කෙතරම් ප්‍රබල ද යන්න මෙයින් පැහැදිලි වේ.

මෙම හර්තාලය සංවිධානය කළ නායකයින් ද බලාපොරොත්තු නොවූ පරිදි ජනතා නැගිටීම ප්‍රබල වීම නිසා  ද, එය ඉදිරියට ගෙනයාමට වැඩපිළිවෙලක් නොමැති නිසාද සමසමාජය නායකත්වය විසින්ම හර්තාලය නතර කරන ලෙස ජනතාවගෙන් ඉල්ලා සිටීම තුළින් එය පෙනි ගියේ ය. කෙසේ වුවත් මේ අරගලය ඉදිරියට ගෙනයන්නට වැඩපිලිවෙලක් නොමැති නිසා එය පරාජයෙන් කෙලවර වු බව දකින්ට හැකි විණ.

53 අරගලය 2022 අරගලය අතර බරපතල දේශපාලන වෙනස්කම් තිබුණි.  2022 අරගලයට කිසිඳු දේශපාලන පක්ෂ මගපෙන්විමක් නොතිබුණි. සියලු දේශපාලන පක්ෂ ප්‍රතික්ෂේප කළ යුතු යැයි එම අරගලයට සහභාගී වූවන් කියා සිටි අතර පාර්ලිමේන්තුවේ 225 එපා යනුවෙන් හඬ නැගීය. රටතුළ ගොඩනැගී තිබූ දූෂිත අත්තනෝමතික මර්දනකාරී ජන පීඩක මජර ආණ්ඩුකරණයට එරෙහි පැනනැගුන අරගලයක් ලෙස එය විද්‍යාමාන විය. 53 හර්තාලයේදී එවකට සිටි ඩඩ්ලි සේනානායක අගමැතිවරයා එලවා දැමීමට නොහැකි වුවත් 2022 අරගලයේ දී අගමැති මහින්ද රාජපක්ෂ හා ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ එලවා දැමීමට හැකි වීම ලාංකීය ඉතිහාසයේ අතිවිශේෂ සිදුවීමක් විණ.
මේ අරගලය සඳහා ඒකරාශී වූ ජනතා බලවේග වලින් හඬනගා කියාපෑවේ අල්ලස සහ දූෂණය පිටුදකින ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් අවශ්‍ය බවය. සමාජ ක්‍රමයේ බරබතල පරිවර්තනයක් නොව (හිච්‍ප ජය්බටැ එකක්) අවශ්‍ය යැයි කියා පෑවේය. එය ඇත්තටම සමාජ සංශෝධනයක් ලෙස ප්‍රකාශයට පත්විය.
කෙසේ නමුත් මේ සුවිශේෂ වූ අරගලයෙන් පසු අද වනවිට පවතින තත්වය අතිශය වේදනාකාරී වූත් සංකීර්ණ වු හැඩගැසීම්වල දිගුවකි. අරගලයේ ප්‍රතිඵලයක් ලෙස බලයට පැමිණි රනිල් වික්‍රමසිංහ ජනාධිපතිවරයා එම අත්දැකීම් පාවිච්චි කරමින් කිසිදු සාමකාමී උද්ඝෝෂණයකට ඉඩ නොදෙන දැඩි මර්දනකාරී යාන්ත්‍රනයක් පවත්වාගෙන යාමට පොලීසිය හා හමුදාව යොදා ගනිමින් සිටී. මේ අතර පීඩිත සමාජ බලවේගවල විරෝධය මර්දනය කිරීමට කටයුතු කරමින් සිටී. මෙමඟින් රාජපක්ෂ පවුල් පාලනය අරක්ෂාකර ගනිමින් විවිධ වේට්ටු හරහා නොයෙකුත් රූපකයන් ආරක්ෂා කරගනිමින් ජනතා මතයට සවන් නොදී පළාත් පාලන මැතිවරනය ද නොපවත්වා ඒකාධිපතීත්වයක් ගොඩනැගීමට කටයුතු කරමින් සිටී. මේ සඳහා ත්‍රස්තවාදය වැළැක්වීමේ නීති හා මාධ්‍ය මර්දනය කිරීමට විවිධ අණපනත් ගෙන ඒමට කටයුතු කරමින් තිබේ.

මේ දරුණු මර්දනයට එරෙහිව තැන තැන විවිධ උද්ඝෝෂණ මතු වුවත් පළල් අරගලයක් නිර්මාණය වන බවක් නොපෙනේ. පාර්ලිමේන්තුව නියෝජනය කරන සම්ප්‍රදායික විපක්ෂ දේශපාලකයින් පාර්ලිමේන්තුව තුළ පුහු වීරයන් වීමට උත්සහ කරනවා විනා ජනතා සහයෝගීත්වයෙන් සිදුවන වීදි අරගල ක්‍රමයක් ගැන උත්සුක වන බවක් නොපෙනේ. ඔවුන්ගේ ප්‍රධාන ඉලක්කය වී ඇත්තේ කෙසේ හෝ පාර්ලිමේන්තුව විසුරුවා හැරගෙන ඊලඟ පාලන කණ්ඩායමක් බවට පත්වීමය. ඉතිහාසයේ මැකීයන දේශපාලන පක්ෂයක් තිබූ එ.ජා.ප. ජනාධිපති බලය පාවිච්චි කරමින් නැවත ඉදිරියට ඒමට උත්සහ කරමින් සිටින අතර පොහොට්ටු පක්ෂයේ නායකයින් රනිල් වටා ඒකරාශී වන බවක් ද දකින්නට හැකිය. සියයට 2 ක ඡන්ද පදනමක් තිබූ රනිල් වික්‍රමසිංහ මේ ලොතරැයියෙන් උපරිම කාල සීමාවක් රැඳී සිටීමට උත්සහ කරමින් සිටී. ඒ සඳහා ඔහුට කල හැකි හැම දෙයක්ම කරන බවට කිසිදු දෙගිඩියාවක් තබාගත යුතු නැත.

ජනතා අරගලයෙන් පොහොට්ටු පක්ෂයට අහිමු වූ ජනාධිපතිවරයාත් ආණ්ඩුවත් නොමැතිවීම නිසා ජනතාව කෙරෙහි බද්ධ වෛරයකින් පෙලෙන පොහොට්ටු පක්ෂය රනිල් යොදා ගනිමින් උපරිම මර්දනය දියත් කිරීමට සහයෝගය ලබා දෙමින් ඔවුන්ගේ පැවැත්ම ආරක්ෂා කර ගැනීමට කටයුතු කරමින් සිටී. ඔවුන් නීතිය සාමය ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කිරීම ගැන කරන කථා බොරු විගඩම්කාරී ක්‍රියාවක් වනු ඇත.

මෙවන් සමාජ පසුබිමක් තුල රනිල් අවසන් වරටත් උත්සහකරමින් සිටින්නේ ඔහුගේ පරණ පුරුදු ආර්ථික සැලසුම් ක්‍රියාවට නැගීමටය.  රනිල් වික්‍රමසිංහ අපේක්ෂා කරන ඊනියා සංවර්ධනය පසුගිය මාසයේ ලෝක බැංකුව ඉදිරිපත් කළ ආර්ථික දත්ත අනුව සිහිනයක් බවට පත්වන බව පෙනේ. ලොකු බැංකු වාර්තා පෙන්වා දෙන්නේ ලංකාවේ ආර්ථිකය තවදුරටත් කඩාවැටෙමින් තිබෙන බවය. 2023 වසරේ ඍණ 4.3 ක් පහත වැටී තිබු තත්වය තවදුරටත් පවතින බවය. ලංකාව දුප්පත්කම අතින් ආසියාවේ රටවල් අතරින් සිටින්නේ 18 වන ස්ථානයේ බව ද ලක්ෂ 225ක් වන ජනගහනයෙන් රටේ දුප්පත්කම ලක්ෂ 55 දක්වා වර්ධනය වී ඇති බව පෙන්වා දී තිබේ. ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව අනුව පවුල් 14,98,649 ක් දුප්පතුන් බවට පත්වී තිබේ. ලංකාවේ ණය බර එන්න එන්නම වැඩිවෙමින් තිබේ. මහ බැංකුව, ප්‍රකාශ කරන්නේ ලංකාව රුපියල් ට්‍රිලියන 15 ක් හෙවත් ඇමරිකානු ඩොලර් 4.7 ක් ණය වී ඇති බවය. රටේ මුලු විදේශ ණය ප්‍රමාණය රුපියල් ට්‍රිලියන 12.5 ක් වේ. පසුගිය මාසයේ රුපියල ශක්තිමත් වන බවට කරනු ලැබූ ප්‍රකාශ කෙසේ වුවත් මේ වනවිට එය අවප්‍රමාණය වෙමන් පවතී. එමෙන්ම ආනයන සීමාවන් තවදුරටත් බලපවත්වන පසුබිමක හා ප්‍රාග්ධනය රටින් පිටතට ගලායාම සීමාවෙමින් පවතී. මේ වසර අවසානයේ ඩොලරයේ අගය රුපියල් 350 පමණ ඉහළයා හැකි බව :ඊකමපඉැරට* ආයතන පෙන්වා දී තිබේ. විශේෂයෙන් දෙවන ණය වාරිකයට අවශ්‍ය කොන්දේසි තවමත් සම්පූර්ණ කිරීමට පාලකයින් අසමත් වී ඇති බවය. දේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීම තුළින් මුල්‍ය අර්බුදය තවත් උග්‍රවීමට පුළුවන. මේ ඇති වන අර්ථික අර්බුදය ඉදිරි මාසවල දී තවත් උග්‍රවනු ඇත. විශේෂයෙන් ඈජන හා ඈඔන අරමුදල් වලින් අත පෙවීමට දරණ උත්සහය රනිල් පාලනයට කණකොකා හැඩීමක් වනු ඇත.

2022 වසරේ රජයේ මුළු ආදායම රුපියල් බිලියන 2021ක් වු අතර රජයේ වියදම රුපියල් බිලියන 4472ක් බව වාර්තාවේ. මෙලෙස ආදායමට වඩා වියදම වැඩිවීම අර්බුදය තිව්‍ර වීමට හේතු වනු ඇත. ලංකාවේ ඇගලුම් වලට ලෝක  වෙළඳ පොලේ තිබු ඉල්ලුම අඩු වීම නිසා විශාල ප්‍රමාණයක රැකියා නොමැති වීමේ අනතුරක් තිබේ. මේ අතර සුළු හා මධ්‍යම පරිමාණ කර්මාන්ත විශාල ප්‍රමාණයක පවත්වාගෙන යාමට අමුද්‍රව්‍ය නොමැති නිසා ඒවා අතහැර දැමීමට සිදු වෙමින් තිබේ. ජලය විදුලිය දුරකථන ඇතුලු සෑම සේවාවන්ටම වැඩි වන්නේ මිනිසාට දරාගන්න විනා සිතා ගන්නට බැරි මට්ටමින්ය. මේ අතර ඇති විශාල බදු කන්දක් ජනතාව මත පටවා ඇති අතර එය ඉදිරියටත් තවතවත් ඉහළ යාම කිසිවෙකුටත් නොවැලක්විය හැකිය.


මෙම සියලු තත්වයන් යටතේ වැඩි වශයෙන් පිඩාවට පත්වන්නේ පිඩිත ජනතාවය. ඔවුන් එදිනෙදා පිවිතය පවත්වාගෙන යාම සඳහා මාරාන්තික සටනක යෙදි සිටින අතර ඉදිරියේ මේ තත්වය තවත් උග්‍ර වනු ඇත. රාජ්‍ය සේවයේ 80% කට වඩා ලබා ගන්නා වැටුප ඔවුන් පිවිකාව පවත්වාගෙන යන්නට ප්‍රමාණවත් නොවේ. අදවන විට ඔවුන් නම්බුනාර හිගන්නන් බවට පත් වී සිටිති. කර්මාන්ත බිඳ වැටි ඇති තත්වය හමුවේ තරුණ තරුණියන්ට රැකියාවන් සොයා ගැනීම අතිශය දුෂ්කර

6 වන පිටුවට

මහින්ද දේවගේ

# ජේ.ආර් මාමා ගිය පාරේ යන රනිල් බෑනා..

..ඉන්දියාවේ බලපෑම් මතද ද්‍රවිඩ ධනපති නායකයින්ගේ ද ඉල්ලීම අනුව 13 වන ව්‍යවස්ථාවට අනුව බලය බෙදීමට කැමැත්ත ලබා දෙන බව ප්‍රකාශකර සර්වපාක්ෂික සමුළුවක් ද කැඳවීමට ක්‍රියා කළේ ය. එම සමුළුව ආරම්භයේදී ම රනිල්ගේ උපක්‍රමය රට ඉදිරියේ හෙළි දරව් විණි. ඔහුට අවශ්‍ය වුයේ නැවත වතාවක් දෙමළ භාෂාව කතාකරන ජනතාව රැවටීමයි. මෙය ප්‍රෝඩාවක් බව රට ඉදිරියේ හෙළදරව් වී තිබේ..



ජේ.ආර්. ජයවර්ධන හඳුන්වාදුන් විධායක ජනාධිපති ක්‍රමය ලාංකීය සමාජයේ ක්‍රියාව නැගෙමින් තිබෙන කාලය වසර 45ක් පමණ වේ. මෙම විධායක බලයේ සරල තේරුම වන්නේ තනි පුද්ගලයෙකුට අවශ්‍ය පරිදි තීන්දු තීරණ ගනිමින් තම සිතගියාව අනුව රට පාලනය කිරීමය. ලෝකයේ බොහෝ රටවල මෙලෙස සමාන බලයක් තිබෙන ජනාධිපති වරුන් සිටී.  ඒත් මෙලෙස තනි පුද්ගලයෙකු වටා සංකේන්ද්‍රය වන බලයක් එම රටවල දකින්නට නැත. විශේෂයෙන්ම  ප්‍රංශය, ඇමරිකාවේ මේ තත්ත්වය දකින්නට නැත. මේ රටවල විශේෂ වන්නේ විධායක ජනාධිපති යන නම ඔවුන් භාවිතයට නොගැනීමයි. මේ විධායක බලය යන නාමය තුළම ඒකාධිපති හැඩරුවක් ගම්‍ය වී තිබේ.

ජේ.ආර්.ජයවර්ධන ලංකාවේ පළමුවන විධායක ජනාධිපති වරයා දේශපාලන යාන්ත්‍රණය තමා වටා සංකේන්ද්‍රණය කර ගැනීමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ද ගොඩනගා ගැනීම මගින් එකී යාන්ත්‍රන රාමුව ආරක්ෂා කර ගැනීමට ද කටයුතු කරන ලදි. මෙහි දී ව්‍යවස්ථාදායකය අධිකරණය එම බලය පවත්වාගෙන යන ආයතන බව පෙන්නුම් කර තිබේ. ඔහුගේ අභිලාෂයට ගැලපෙන පරිදි සකස් කර ගන්නා ලද ආණ්ඩුක්‍රමයක් ද ආර්ථික වැඩපිළිවෙලක් ගොඩ නගා ගැනීමට කටයුතු කරණු ලැබීය. මේ සඳහා රාජ්‍ය ව්‍යුහයක් සකස්කර ගනු ලැබුවත් ජනාධිපති වරයා ලබා දෙන නියෝග ක්‍රියාවට නැගීමට නිලධාරී බැඳී සිටි. එම නිලධාරීන් පත්කිරීම හා ඉවත් කිරීම ද ඔහුගේ සිතගියාව අනුව සිදු කෙරේ.

මෙම පාලනය පවත්වාගෙන යාම මගින් ප්‍රාග්ධන හිමිපන්තිය සතු දේපල ආරක්ෂා කිරීම ජනාධිපතිවරයාගේ මුලික අරමුණ වේ. ඒ සඳහා ඔවුන්ට දැඩි ආරක්ෂාවක් ලබා දීමට ද පාලන යාන්ත්‍රණයේ කොටස්කරුවන් කර ගැනීමට ද සිදු කෙරෙනු ඇත.

ජේ.ආර් ගෙන් පසු බලයට පැමිණි ආර්.ප්‍රේමදාස, චන්ද්‍රිකා කුමාරතුංග, මහින්ද රාජපක්ෂ ද ජේ.ආර්. අනුගමනය කරනු ලැබු පිළිවෙත ඉදිරියට ගෙන යන්නට කටයුතු කළේ ය. අවසන් වශයෙන් ජනාධිපති වරයෙක් ලෙස බලයට පත් වු ගෝඨාභය රාජපක්ෂට ඉහත ආධිපත්‍ය තහවුරු කර ගැනීමට නෙහැකි වුයේ තිව්‍ර අර්බුදයකට රට මුහුණ දී තිබුබැව්ණි.


ජේ.ආර් අනුගමනය කරමින් ඉහත පාලකයින්ද තම අධිකාරිවාදී බලය පවත්වා ගෙන යන්නට කටයුතු කළේ ය. විධායක බලය ඉවත් කරන බවට විවිධ ව්‍යවස්ථා සංශෝධන ද ගෙන එමින් තිබුණි. පොදු පෙරමුණ සහ යහපාලන ආණ්ඩුක්‍රම යටතේ 17 සහ 19 වැනි සංශෝධනද ගෙන එන්නට ක්‍රියා කළේ ය. ඒත් විධායක බලය සීමාවීමක් හෝ ඉවත්වීමක් සිදු වුයේ නැත. මේ සියලු තත්ත්වයන් යටතේ ජනතාවට තනිපුද්ගල අධිකාරිවාදි පාලනය එපා වෙමින් තිබුණි.

විධායක බලයට එරෙහි ජනතා මතය සමාජයේ යටිතලයේ වර්ධනය වෙමින් තිබුණු අතර පාර්ලිමේන්තුවේ 225 එපා යන මතය දිගින් දිගටම දිකින්නට ලැබුණි. මෙම මතය සංවිධානාත්මක ඉදිරියට පැමිණියේ 2022 මාර්තු , අප්‍රේල්, මැයි, ජුනි යන මාසවලදී ය. රාජපක්ෂලාගේ සමස්ථ පාලනය බිඳවැටීම ද, එහි ප්‍රතිඵලයක් නිසා ඇති විය. අරගලය නිසා බිඳ වැටුණු ප්‍රභූතන්ත්‍රයේ බලය නැවත කළමණාකරණය කර ගැනීමට බලයට පැමිණි අනුප්‍රාප්තික ජනාධිපතිවරයා වුයේ රනිල් වික්‍රමසිංහ බව දකින්නට හැකි විණ. ඔහු ලාංකේය සමාජයේ බලයට පැමිණියේ මැතිවරණයකින් නොවේ. ව්‍යවස්ථාවේ තිබෙන කඩතොලු පාවිච්චි කරමින් පොහොට්ටු පක්ෂයේ පාර්ලිමේන්තුවේ වැඩි දෙනාගේ කැමැත්ත රනිල් වික්‍රමසිංහට ලැබීම නිසා ඔහු ජනාධිපතිවරයා බවට පත්විය. ජේ.ආර් ජයවර්ධන විසින් නිර්මාණය කරනු ලැබු ඊනියා ව්‍යවස්ථාවේ බලමහිමයෙන් බලයට පැමිණි රනිල් හැසිරෙන්නේ ඔහුට ජනතාව ස්වකැමැත්තෙන් බලය ලබා දුන්නා වැනිය. ඔහු තම බලය තහවුරු කර ගැනීම වෙනුවෙන් විවිධ උපක්‍රම පාවිච්චි කරමින් තිබේ. මේ සඳහා රට ව්‍යසනයෙන් බේරා ගැනීමට සියළු පක්ෂවලට ආරාධනා කළේ ය.

ඉන්දියාවේ බලපෑම් මතද ද්‍රවිඩ ධනපති නායකයින්ගේ ද ඉල්ලීම අනුව 13 වන ව්‍යවස්ථාවට අනුව බලය බෙදීමට කැමැත්ත ලබා දෙන බව ප්‍රකාශකර සර්වපාක්ෂික සමුළුවක් ද කැඳවීමට ක්‍රියා කළේ ය. එම සමුළුව ආරම්භයේදී ම රනිල්ගේ උපක්‍රමය රට ඉදිරියේ හෙළි දරව් විණි. ඔහුට අවශ්‍ය වුයේ නැවත වතාවක් දෙමළ භාෂාව කතාකරන ජනතාව රැවටීමයි. මෙය ප්‍රෝඩාවක් බව රට ඉදිරියේ හෙළදරව් වී තිබේ.

මේ සියලු උපක්‍රම මැදින් තම දේශපාලන බලය තහවුරු කර ගැනීමේ උත්සහය ඔහු අතහැර නොමැත. ඒ සඳහා පළමුව ජනාධිපතිවරයා පාර්ලිමේන්තුව තම ජනාධිපති දුරයේ පාලනය යටතට ගෙනවීමට සහ ඒ මගින් ව්‍යවස්ථාදායකය හා විධායකය අතර සම්බන්ධය විධායකයට වැඩිවෙන ලෙස සකස් කර ගැනීම. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අර්ථකථනය කිරීමේ හා ව්‍යවස්ථාමය ගැටළු අර්ථනිරූපණය කිරීමේ අධිකරණ කාර්යයට වක්‍ර ලෙස බලපෑම් කරමින් 2015 - 2019 කාලය තුළ අලුතෙන් ගොඩ නැගී තිබුණු ස්වාධීන අධිකරණයක් පිළිබඳ කථිකාව සහ භාවිතය ආපස්සට හැරවීම.

2022 ලාංකේය සමාජයේ මතු වු ජනතා නැගිටීම නැවත ඇති නොවන පරිදි අක්‍රීය කිරීමද ඒ සඳහා රාජ්‍යතන්ත්‍රය ශක්තිමත් කිරීමද ජනතාව මර්දනයෙන් බිය ගැන්වීමද වේ. ජේ.ආර් 1980 දශකයේ  ගනු ලැබු මර්දනකාරි පිළිවෙත නැවත ඉදිරියට ගැනීමට ද රනිල් උත්සහ කරමින් තිබේ. රනිල්ගේ මර්දනකාරී පිළිවත පරාජය කිරීමට විපක්ෂය බලාපොරොත්තු වන්නේ ඉදිරියේ පැවැත්වෙන ඡන්දයකින් බව පෙනේ. මේ වන විට සජබයට හා ජජබයට රනිල්ගේ මර්දනය පරාජය කිරීමට බලාපොරොත්තු වන්නේ ඉදිරියේ පැවැත්වෙන ඡන්දයකින් බව පෙනේ. මේ වන විට සජබයට හා ජජබයට රනිල්ගේ මර්දනය පරාජය කිරීමට දේශපාලන දැක්මක් නැති නිසා රනිල් එම විෂයේ නිදාශීලීභාවය තම පැවැත්ම වෙනුවෙන් පාවිච්චි කරමින් සිටින බව පෙනේ. මේ සඳහා අර්ධ පොලිස් මිල්ටරි බලයත් පාවිච්චි කරමින් ඔහු උපරිම කාලයක් පැවතීමට ගන්නා උත්සහය පරාජය කළ යුතුය. මේ සඳහා කම්කරු පන්තිය ඇතුළුව සෙසු පීඩිත ජනතාව බලමුළු ගැන්වීමේ කථිකාවතකට මුල පිරීම විප්ලවකාරී සමාජ බලවේගවල වගකීමක් වේ. ■



මහින්ද දේවගේ

# ජවිපෙට එරෙහි පෙරටුගාමී පැමිණිලි

# වාමාංශිකයින්ගේ භාවිතයට ගැළපෙන්නක් ද?

2012 වර්ෂයේදී පෙරටුගාමී සමාජවාදී පක්ෂය බිහිවූයේ ජනතා විමුක්ති පෙරමුණේ අවස්ථාවාදී දේශපාලනයට එරෙහිව කරනු ලැබූ සංවාදයකින් පසුව බව ප්‍රකාශයට පත් කරන ලදී. ඔහුන් ජවිපෙන් ඉවත් වීමට හේතු වූ කරුණු සඳහන් කර 1978-2012 ජවිපෙ ගමන් මඟ පිළිබඳ ස්වයං විවේචනාත්මක ආපසු හැරී බැලීමක් හා අනාගතය වෙත ප්‍රවේශයක් යන නමින් පොතක් එළි දැකිවීමට කටයුතු කලේය.1965 උපත ලැබූ ජවිපෙ පිලිබඳ 1978 / 2012 වසර 34 කට ස්වයං විවේචනය සීමා කළේ එම කාලය තුළ පක්ෂයේ නායකයාව සිටි රෝහණ විජේවීර නිසාය. පෙරටුගාමීන්ගේද දේශපාලන නිර්මාතෘ වරයා විජේවීර වීම එයට හේතුව වේ.

ජවිපෙන් වෙන්වී පෙරටුගාමී පක්ෂය බිහි වීම නව වමකට අලුත් විවරයක් පදා ගැනීමක් බව පෙනී ගියත් මේ වන විට එය ප්‍රශ්නාර්ථයක් බවට පත්වී තිබේ. ''නවවමක්'' බිහිවීමේ ලක්ෂණ එලෙස අවධාරණය කරනු ලැබූවත් පක්ෂයේ දේශපාලන සිමාවන් අතිශය ජාතිවාදී හැඩරුවක් ගත් බව පසුව පෙනී ගියේය. මාක්ස්වාදී මූලධර්ම පිළිබඳව නිවැරදි අස්ථානයන් නොතිබුණු අතර ජාතික ප්‍රශ්න විසදීම වැනි කරුණුවල ජවිපෙ මතවාදයෙන් පූර්ණ ලෙස වෙන් නොවූ බව දක්නට හැකි විය. මේ පිළිබඳව යම් පිරිසක් කියා සිටියේ ජවිපෙ හා පෙරටුගාමී පක්ෂය එකම කාසියේ දෙපැත්තක් බවය. පෙසපය බිහිවී වසර 10ක් ඉක්ම යන මොහොතේ පවා මෙම දේශපාලන ඌණතාවය දකින්ට හැකි අතර ඔවුන්ට ජවිපෙ දේශපාලන ජාන ලක්ෂණවලින් පූර්ණ ලෙස කැඩී වෙන් වීමට නොහැකි වූ බව පෙනී ගොස් තිබේ.

1965 ජවිපෙ බිහි වීමට පසුබිම සකස් වූයේ සාම්ප්‍රදායික වමේ පක්ෂ ලෙස තිබූ ලංකා සම සමාජ පක්ෂය සහ කො.ප සහ ශ්‍රී.ල.නි.ප සමඟ හවුල්ආණ්ඩුවකට ඇතුල් වීමේ ගැඹුරු දේශපාලන සංසිද්ධීයක ප්‍රතිඵලයක් ලෙස බව පසුගිය කාලය පුරා කථිකාවට බදුන් වී තිබුණි. 1953 හර්තාලයෙන් ප්‍රකාශයට පත් කෙරුනා වූ 1950 ගණන්වල කම්කරු පන්තියේ පෙරලිකාරීත්වයට වළ කැපීම සඳහා අවිස්සූ ශ්‍රීලනිපයේ සිංහල අධිපතිවාදයට ල.ස.ස.ප අනුගත වීමය. මෙම සාම්ප්‍රදායික පක්ෂ අනුගමනය කරනු ලැබූ පන්ති සහයෝගීත්වය දේශපාලනයේ ප්‍රතිඵලයක් ලෙස බිහිවූ විකෘති දේශපාලන ප්‍රපංචය වුයේ ජවිපෙ බව දකින්ට හැකි විණි. ජවිපෙ බිහි වීමේ සිට එහි පන්ති පදනම සුළු ධනේෂ්වර වූ අතර ගැමි ගොවි සමාජ බලවේග අතර ඔවුන් දේශපාලන කටයුතු කරමින් තිබුණි. ස්ටැලින්වාදී කෙමියුනිට් පක්ෂයේ සාමාජිකයකු වි සිටි විජේවීර එම කණ්ඩායමෙන් ඉවත් වී ලංකා කොමියුනිට් පක්ෂය ලෙස පෙනී සිටි මාඕවාදීන් සමඟ එකතු වී කටයුතු කරන ලදී. පසුව එම පක්ෂයෙන්ද ඉවත්වී ජවිපෙ ගොඩ නැගිමට කටයුතු කළේය. ස්ටැලින්වාදය හා සිංහල ජාතිවාදයද ඔවුන්ගේ මතවාදයේ පදනම බවට පත් විණි. ජාතික විමුක්තිය හා දෙශප්‍රේමය ඔවුන්ගේ සටන්පාඨවල අන්තර්ගත විය. ''ජනතවට විමුක්තිය'' ''අධිරාජ්‍යවාදයට විනාශය'' ''මව්බිම නැතිනම් මරණය'' වැනි සටන්පඨ 1971 දි කැරැල්ලට පෙර සිට තාප්ප බිත්ති වල විශාල අකුරින් ලියන්නට කටයුතු කළේය. කම්කරු පන්තිය හෙවත් නිර්ධන පන්තිය විප්ලව වාදී බලවේග ලෙස අර්ථ ගැන්වූයේ නැත. මේ නිසාම මාක්ස්වාදී මූලික පන්ති විග්‍රහයක් ඔවුන්ට නොමැති විණ. නිර්ධන පන්තිය ලෙස ගම්බද දුගී පීඩිත බලවේග විප්ලවයේ තීරණාත්මක පන්තිය ලෙස විග්‍රහ කරන්නටකටයුතු කළේය. ඔවුන් මුල සිටම ජාතික සීමාවක් මත පදනම් වී කටයුතු කළේය. මේ නිසාම දේශියත්වයට ගැලපෙන මතවාදයක් අවශ්‍යයැයි කියමින් කරනු ලැබූ කරුණු දැක්වීම් වලින් ගම්‍ය වූයේ නිර්මාක්ස්වාදි දේශපාලනය මුල සිටම තිබූ බවයි. ලාංකීය දේශපාලනයේ ප්‍රධාන ධනපති පක්ෂවලින් වෙන්වී කටයුතු කරන බව කියා සිටියත් මුළු ඉතිහාසය තුළම එම පක්ෂ බලයට පත් කිරීමේ කටයුතුවලට දායක වි තිබේ. පැරණි වාමාංශික පක්ෂ අනුගමනය කරනු ලැබූ ධනපති හවුල් ආණ්ඩු දේශපාලනය ප්‍රතික්ෂේප කරනු ලැබූවත් 1980 දශකය වනවිට ජවිපෙ විවෘතව එම ධනපති පක්ෂ සමඟ එකතු වී මැති ඇමතිකම් ලබා ගැනීමට කටයුතු කළේය. 1994 චන්ද්‍රිකා බලයට පත් කිරීමට තම පක්ෂයේ අපේක්ෂකයා ඉවත් කර ගැනිමට කටයුතු කළ අතර පසුව චන්ද්‍රිකා ආණ්ඩුව සමඟ පරිවාසයකට යන්නට තීරණය කළේය. මේ ගමන් මඟ තුළ ඉතිහාසයේ තීරණාත්ක පවාදීම කරනු ලැබුවේ 2005 දී මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා බවට පත්කිරීමට ගනු ලැබූ තීන්දුවක් සමඟය. ඔවුන් එම මැතිවරණයේ කියා සිටියේ මහින්ද රාජපක්ෂ දේශමාමක බලවේගවල නියෝජිතයා බවත් රනිල් වික්‍රමසිංහ විජාතික බලවේගවල නියෝජිතයා බවත්ය. එල්.ටී.ටී.ඊ. බෙදුම්වාදය පරාජය කිරිම ඔවුන්ගේ දේශපාලන න්‍යාය පත්‍රයේ අංක එක බවට පත් කර ගන්නා ලදී.

මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා බවට පත් කර ගැනීමේ ප්‍රචාරක යාන්ත්‍රණයේ ප්‍රධාන කොටස් කරුවා බවට ඔවුන් පත්විණ. ජවිපෙ නොසිටියානම් මහින්ද රාජපක්ෂ බලයට පත් කිරීමට නොහැකි වනු ඇත. මෙවන් තත්වයක් තුළ වසර 75 ක ඉතිහාසයේ විනාශයට ඔවුන්ද වගකිව යුතුව තිබේ. එයින් ගැලවීමට ජවිපෙ ගන්නා උත්සාහයට කිසිදු දේශපාලන පදකමක් නොමැත. විශේෂයෙන්ම එල්.ටී.ටී.ඊ. බෙදුම් වාදය පරාජය කිරීමට හිටපු හමුදා පතියෙකු වූ සරත් ෆොන්සේකා තම පක්ෂයේ අපේක්ෂකයා බවට පත් කර ගන්නා ලදී. මේ මගින් ඔවුන්ගේ දේශපාලන නිරුවත දකින්ට හැකිවිණ. එවන් පසුබිමක් තුළ ජවිපෙ ඉතිහාසයට එකතු වී ඇත්තේ දෙමළ ජාතිය සංහාරය කිරීමට උඩගෙඩි දුන් පක්ෂයක් ලෙසය. ලංකාවේ ජාතික ප්‍රශ්නය විසදීමට හැක්කේ කෙසේද යන බරපතල දේශපාලන ප්‍රශ්නය පිළිබඳ පැහැදිලි විසදුමක් ඉදිරිපත් කිරීමට නොහැකි වී ඇත. ජාතික ප්‍රශ්නය විසදීම හැක්කේ අනාගතයේ ගොඩනගන සමාජවාදී පාලනයකින් බව පසුගිය දශකවලදී කියා සිටියේය. මේ වන විට සංවාදයට භාජනය වන 13 ලබාදෙන බවට කරන ලද සංවාදයේදී ඔවුන්ගේ ස්ථාවරය ඉදිරිපත් කරන්නේ නැත. මෙයින් පැහැදිළිවන්නේ එම පක්ෂය තවමත් පරණ දේශපාලන ස්ථාවරයන්වල සිටින බවයි.

## ජවිපෙ පිළිබඳ පෙරටුගාමීන්ගේ පැමිණිලි

ජවිපෙ හා ධනපති පාලකයින් අතර තිබෙන අනියම් සම්බන්ධතා හෙලිදරව් කිරිමින් දුමින්ද නාගමුව කියා සිටියේ යුරෝපයේ දූපතක ආයෝජන කිරීම සඳහා ජවිපෙ හා ටිරාන් අලස් ගොස් ඇති බවය. මෙලෙස චෝදනා නගමින් අපරාද පරීක්ෂණ අංශයේ පිහිට පැතීම වාමාංශිකයින්ගේ භාවිතයට ගැලපෙන්නක්ද යන්න අවධානයට යොමු කළ යුතුය.

අද අවශ්‍ය වන්නේවත්මන් අර්බුදයේදී ජවිපෙ අනුගමනය කරන දේශපාලන පිළිවෙත හෙළිදරව් කිරීමයි. ඉතිහාසයේ සෑම අවස්ථාවකම සුළු ධනේෂ්වර පක්ෂවල පුද්ගල විවේචනය ප්‍රමුඛස්ථානයක් ගනු ලැබීය. 2009 යුද්ධයේදී පෙරටුගාමීන් සමඟ සිටින වත්මන් නායකයින් ජවිපෙ ප්‍රධාන නියමුවන් බවට පත්වී සිටියේය. එවන් තීරණාත්මක අවස්ථාවක එයට එරෙහිව පෙනීසිටීමට ඔවුනට නොහැකි විණ. ජවිපෙ හා පෙරටුගාමීන් අතර ජාතික ප්‍රශ්නයේදී ගනු ලබන ස්ථාවරය අතර බලතල වෙනස්කම් නොමැත. පෙරටුගාමීන්ද කියා සිටින්නේ ජාතික ප්‍රශ්නය විසදීමට හැක්කේ සමාජවාදී පාලනයක් තුළ බවයි. ජාතික ප්‍රශ්නය ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදයේ ගැටළුවක් බවට කරන මාක්ස්වාදී විග්‍රහය මත පිහිටා කටයුතු කිරීමට ඔවුනට නොහැකි වී ඇත. පෙරටුගාමීන් වත්මන් අර්බුදයට විසදුම සාමාජවාදය බවට ප්‍රකාශ කරනු ලැබූවත් එය සාක්ෂාත් කර ගැනීමට ඉදිරි දර්ශනයක් මත පිහිටා කටයුතු කරන බවක් දකින්ට නොහැකිය. ඔවුන් ජාතික සීමාවක් මත සමාජවාදය සාක්ෂාත් කර ගැනීමට පෙනී සිටීම මගින් පෙනීයන්නේ ජාත්‍යන්තර දැක්මක් ඔවුනට නොමැති බවත්ය.

පෙසපප පසුගිය වර්ෂවල ග්‍රීසියේ සිරිසා සංවිධානයට ආකර්ෂණය වී කටයුතු කළේය. සිරිසා ව්‍යාපාරයට මතවාදය ගොඩ නැගූ ස්ලේවෝයි ශීෂෙක් තම ගුරුවරයෙකු ලෙස අර්ථ ගන්වන ලදී. සිරිසා සංවිධානය පිළිබඳ ඔවුනගේ සාකච්ඡා සම්මන්ත්‍රණ වලදී උජාරුවෙන් කතා කළේය. මේ වන විට සිරිසා සංවිධානය ග්‍රීක ධනපති ක්‍රමය ඉදිරියට ගෙයාමට යුරෝපා සංගමයට කැපවූ සංවිධානයක් බවට පත්වී තිබේ. සිරිසා ව්‍යාපාරයට මතවාදී විග්‍රහය ඉදිරිපත් කළ ''ශිෂේක්''සම්මුඛ සාකච්ඡාවේදී කියා සිටියේ ඔහු මාක්ස්වාදියෙකු බවයි. ඒත් පැරණි කොමියුනිට්ස්ට් වාදය වර්තමානයට වලංගු නොමැති බවය. ඔහු කියා සිටියේ විප්ලවකාරී නැගිටීම් අවසාන වී ඇති අතර එයට තව දුරටත් අනාගතයක් නොමැති බවයි. වත්මන් සමාජ සංදර්භය තුළ ධනවාදී මතවාදය ජයග්‍රාහී තැනක සිටින බවද කියා සිටියේය. මේ තුළ පෙසපප වාර්නණා කළ ශිෂේක්ගේ මතවාදය මගින් පෙනී ගියේ ඔවුන් ප්‍රතිමාක්ස්වාදී ආස්ථානයන් අනුගමනය කළ බවත්ය. කම්කරු පන්තිය විප්ලව වාදී බලවේග යන මාක්ස්වාදි කියමන ඔවුන් අනුමත නොකරති. මේ නිසා විවිධ සමාජ ස්ථරයන් ඒ සඳහා එකතු කර ගත යුතු බව කියා සිටී. කම්කරු පන්ති කොටස් ප්‍රමුඛ වැටුප් ශ්‍රමිකයන්ට ප්‍රමුඛතාවය දිය යුතු බව යන අදහසවල වෙනසක් නොමැති යයි කියා සිටියත් ඒ සඳහා එක් කර ගත යුතු නව බලවේගයන්ගේ ස්වභාව ද්‍රව්‍යමය සමාජ විඥාණයට අදාල ශක්‍යතාවක් හදුනාගත යුතු බව කියා සිටියේය.

පෙසපප මේ සමාජ බලවේගයන් පිළිබඳ පැහැදිලි විස්තරයක් නොකරති. එහෙත් කම්කරු පාන්තික සමාජ ස්ථරයන්වන වෘත්තීය වේදීන් මධ්‍යම පාන්තික කොටස්වල අධිකාරණයට ගැටගැසීම ඔවුනගේ භාවිතය ලෙසට දකින්ට හැකිය. මේ නිසා පෙසපප පන්ති පදනම සුළු ධනේශ්වරය බවට තහවුරු වී ඇත. ඔවුන් පදනම් වන්නේ අන්තර් විශ්වවිද්‍යාලයේ ශිෂය ව්‍යාපාරය තුළය. පෙසපට ගැඹුරු දේශපාලන ඉදිරි දර්ශනයක් නොමැති බව පසුගිය අරගල සමයේදී දකින්නට හැකිවීණ.ඔවුන් එම අරගලයේදී දියවන්නාවෙන් එහාට බලයක් යයි සටන්පාඨ ඉදිරිපත් කරනු ලැබූවත් එය භාවිතයට ගැනිමට කිසිදු වැඩ පිළිවෙළක් නොමැති බව දකින්නට හැකි විණ.

## ජවිපෙ හා ජාතික ජනබල වේගය

පසුගිය දශක කිහිපය පුරාම ජවිපෙ විවිධ බහුජන සංවිධාන ස්වරූපයක් ගොඩනගා ගනිමින් විවිධ සමාජ බලවේග ඒකරාශී කර ගැනීමේ උපායන් අනුගමනය කළේය. ඔවුන් දේශපාලන උපතේ සිට දේශප්‍රේමය ආත්මය කරගත් ව්‍යාපාරයක් බවට පත් වී තිබුණි. ඔවුන් ආමන්ත්‍රණය කළේ දේශප්‍රේමී ජනතාවටය. 1980 දශකයේ දේශප්‍රේමී ජනතා ව්‍යාපාරය ලෙස කටයුතු කරමින් අනුගමනය කරනු ලැබූ දේශපාලන විධික්‍රමය ප්‍රතිවිප්ලවකාරී හැඩරුවක් ගනු ලැබුවේය. වෘත්තීය සමිති නායකයින් ඇතුළු සාම්ප්‍රදායික පක්ෂවල ක්‍රියාදරයන්ට මරණ වරෙන්තු ලබා දෙන බව ප්‍රකාශයට පත් කළේය. පළාත් සභා මැතිවරණයට ඉදිරිපත්වන්නන් ජාතිද්‍රෝහීන් ලෙස ප්‍රකාශ කරමින් ඔවුන් ඝතනය කිරීමට කටයුතු කළේය.


වත්මන් ජාතික ජනබල වේගය මැතිවරණවලට ඉදිරිපත් වීම සඳහා ගොඩ නැගූ සංවිධානයක් බව දකින්නට හැක. මෙමගින් පොදු සංවිධාන රූපයක් වටා ජනතාව පෙළ ගස්වා ගැනීම ජවිපෙ දේශපාලන උපායක් බවට පත් වී තිබේ. ජවිපෙට එකවර ගැනීමට නොහැකි පිරිස් ඒකරාශි කර ගැනීම මෙහි අරමුණ වේ. ජාතික ජනබලවේගය යන නම උපායිකව පාවිච්චි කරමින් ජවිපෙ එහි සංවිධාන යාන්ත්‍රණය හසුරුවනු ලැබේ. ඔවුගේ එකම දේශපාලන ඉලක්කය මැතිවරණයක් ලබා ගැනිමය. කල්දැමූ පළාත් පාලන මැතිවරණය ''කොක්කෙන් හෝ කෙක්කෙන් ''ලබා ගන්නා බව අනුර කුමාර කියා සිටියේය. එකී ප්‍රකාශවලින් කළේ තම සාමාජිකයින්ට නව බලාපොරොත්තු ඇති කිරීමට කටයුතු කිරීමයි. පළාත් පාලන මැතිවරණය ඉල්ලා කොළඹ කැඳවූ උද්ඝෝෂණයේදී අපේක්ෂකයකු මිය ගියේය. එම මිය ගිය අපේක්ෂකයාගේ මරණය ඉතාම සාමකාමී ලෙස මිහිදන් කිරීමට කටයුතු කළේය. සුදු වස්ත්‍රාභරණයෙන් සැරසුනු ජවිපෙ නායකයින් එම මරණයට දේශපාලන ගෞරවයක් හෝ ලබාදීමට කටයුතු කළේ නැත. මේ මගින් ඔවුන්ගේ දේශපාලන බංකොලොත් බව රට ඉදිරියේ ප්‍රදර්ශනය විය. ඔවුන් සාමකාමී පක්ෂයක් ලෙස රට ඉදිරියේ ප්‍රදර්ශනය කරමින් වෙළඳපොළ බලවේග මත පදනම් වී ධනපති ව්‍යාපාරයකින්ගේ අනුකූලත්වය මත පක්ෂ ව්‍යුහය ගොඩ නැගීම එකම අපේක්ෂාව බව දකින්නට හැකිවේ. බටහිර තානාපතියරුන් හමුවෙමින් ජාත්‍යන්තර සහයෝගය ලබා ගැනීමටද කටයුතු කරමින් සිටී. මේ මගින් අනුර කුමාර විකල්ප ධනපති පන්තියේ අපේක්ෂාව බවට පත් කිරීමට උත්සාහ කරමින් සිටී. ජවිපෙ මැතිවරණයකින් බලය ගැනීමේ සිහිනය සැබෑ කර ගැනීම පහසු නොවනු ඇත. ප්‍රාග්ධනය හිමි පන්තියේ පොදු අනුකූලත්වය ගැනීමට ඔවුනට පහසු මගක් නැත. ඉතිහාසය ඔවුන්ගේ දේශපාලන භාවිතය නිසා දේපළ හිමි පන්තිය බලන්නේ සැක සහිතවයි. 1919 ජනාධිපත්වරණයේදී මවා පෑ සමාජ බලය ඡන්ද ප්‍රතිඵලවල්වලින් දකින්නට නොහැකි විය. තම පිරිස් බලය මවා පෙන්වීමට ජවිපෙ දක්ෂ වී තිබුණි. 1982 විජේවීරගේ ජනාධිපතිවරණයේදීද මෙය හොදින් ප්‍රදර්ශනය විණ. දිගින් දිගටම පෙනී ගියේ මැතිවරණයේදී බහුතර ජනතා කැමැත්ත දිනා ගැනීමට ඔවුන්ට නොහැකි බවය. අවම වශයෙන් මැතිවරණය පවත්වන ලෙස පාලකයින්ට බල කිරීමේ ව්‍යාපාරයක් ගොඩ නැගීමට ද ඔවුනට නොහැකි වී තිබේ.

මැතිවරණය තම එකම දේශපාලන විසදුම බවට පත් කරමින් කටයුතු කරන ජවිපයට තම අරමුණු අසාර්ථක කර ගැනීමට නෙහෙකි වීම නිසා ඔවුනගේ අනාගතය අදුරු වනු ඇත. පවතින නව ලිබරල් ආර්ථිකය වඩා හොදින් කළමණාකරණය කිරීම හා වංචා, හොරකම්, දූෂණ නැති කිරීම මගින් අර්බුදයට විසදුම් ලබා දීමට හැකි බවට කරන ප්‍රකාශවල කිසිදු වලංගුතාවයක් නොමැත. ධනපති ක්‍රමයේ ආවේණික ලක්ෂණයක්ව පවතින වංචා සොරකම් දූෂණ ඉතිහාසයේ දිගින් දිගටම දකිනිට ලැබුණි. එවන් තත්ත්වයක් තුළ ජ.ජ.බ ඉදිරිපත් කරන මතවාදයේ බංකොළොත් බව ප්‍රදර්ශනය වී තිබේ. නිමක් නොවන පවත්නා අර්බුදයට ධනපති සීමාවක් තුළ විසදුම් ඉදිරිපත් කිරීමට නොහැකි වී ඇත. ජවිපෙ ඉදිරිපත් කරන ජාතිකආර්ථිකය ගොඩ නැගීම 1970 දශකයේදී ක්‍රියාවට නැගීමට උත්සාහ කළේය. ධනේශ්වර නොවන සංවර්ධන මාවත ලෙස එය අර්ථ ගන්වමින් ක්‍රියාවට නැගුවේය. එමගින් අර්බුදයට විසදුම් ඉදිරිපත් කරන්නට නොහැකි විය. ජවිපෙ වත්මන් අර්බුදයට පිළිතුරු ලබා දිමට ඉදිරිපත් කරන වැඩ පිළිවෙළ ඉතිහාසයේ කිහිප වතාවක් භාවිතයට නගා තිබුණි. මේ සියළු ප්‍රයන්තයන් අසාර්ථක වී ඇති පසුබිමක් තුළ ගැඹුරු සමාජ පරිවර්ථනයක් වෙනුවෙන් පෙනි සිටීම හැර වෙනත් මාවතක් නොමැති බව පෙනී ගොස් තිබේ. ■

**ප්‍රේමචන්ද්‍ර විතාණවසම්**

■ ලියොන් ට්‍රොට්ස්කි ඝාතනය කර වසර 83 යි..!

# ට්‍රොට්ස්කිගේ දේශපාලන පෙර දැකීම් තවමත් වලංගුයි..!



මාක්ස්වාදී නිර්මාතෘවරුවන් අතර ලියෝන් ට්‍රොට්ස්කිට හිමි වන්නේ අතිවිශේෂ ස්ථානයකි. 1940 අගෝස්තු 20 වන දින මෙක්සිකෝවේ කොයො ආකාන්හි පිහිටි ට්‍රොට්ස්කිගේ නිවසේදී රේමන් මර්කේඩර්නම් පී.පී.යු. සෝවියට් රහස් පොලීසියේ ඒජන්තයෙකු විසින් ඔහු ඝාතනය කරන ලදි. ලියෝන් ට්‍රොට්ස්කි නැමති ශ්‍රේෂ්ඨ විප්ලවවාදියා ඝාතනය කර මේ වන විට වසර 83ක් සපිරේ.

ට්‍රොට්ස්කි විසින් ඉතිහාසයට එකතු කරනු ලැබූ විග්‍රහයන් මේ වන විට ජාත්‍යන්තර පරිමාන විප්ලව කාරී බලවේග අතර කථිකාවට බදුන් වෙමින් තිබේ. විප්ලවය පාවාදීම පිළිබඳව ඔයැ ඍැඩදකමඑසදබ ඊැඑර්හැා සහ නොනවතින විප්ලවය පිළිබඳ සංකල්ප මේ අතර ප්‍රධාන මාතෘකා බවට පත්වී තිබේ. විශේෂයෙන්ම 1990 දශකයේ සෝවියට් දේශය බිඳ වැටීමට හේතු වූ කරුණු පෙර දකින්නට ට්‍රොට්ස්කිට හැකි වීම නිසා ඔවුහු මෙලෙස ඉතිහාසයට එකතු විණ.

1917 ඇති වූ ශ්‍රේෂ්ඨ ඔක්තෝම්බර් විප්ලවය පිළිබඳ කියවීම් වලදී ලෙනින් හා ට්‍රොට්ස්කි විසින් ඉටු කරනු ලැබූ නායකත්වයේ වගකීම හා මග පෙන්වීම ප්‍රධාන විය. 1905 විප්ලවයේ ඔහු පෙට්‍රොග්‍රෑඩ් සෝවියට් සභාවේ සභාපතිවරයා විය. රුසියානු විප්ලවයට එරෙහිව මතු වූ ප්‍රතිවිප්ලවය පරාජය කිරීම සඳහා රතු හමුදාව ගොඩ නැගීමට නායකත්වය ලබා දුන්නේ ට්‍රොට්ස්කි විසිනි. රුසියානු විප්ලවය ආරම්භ වීමට පෙර සිට එහි අනාගත ගමන් මග පිළිබඳ කරුණු ලද පුරෝකථනයන් භාවිතයට නැගුවානම් වත්මන් ලෝක දේශපාලනයේ ඇති විය හැකි පරිවර්තනය වෙනස් ගමන් මගක් ගැනීමට බොහෝ ඉඩකඩ තිබුනි.

යටත් විජිත හා අර්ධ යටත් විජිත රටවල විප්ලවය සාර්ථක කර ගැනීමට තිබෙන ධනපති ප්‍රජාතන්ත්‍රවාදයේ ගැටළු ඔහු විග්‍රහ කරණු ලැබුවේ නොනවතින විප්ලවය යන සංදර්භය මත කරනු ලැබූ න්‍යායික විග්‍රහය පදනම් කර ගනිමිනි. නොනවතින විප්ලවයේ පදනම මත පිහිටා පළමුව කරුණු ඉදිරිපත් කළේ කාල්මාකස් විසිනි. මාක්ස් ( ඖබසබඑැරරමචඑා ඍැඩදකමඑසදබ ) කෘතිවල අඛණ්ඩ විප්ලවය යන නාමයෙන් කරුණු දක්වන ලදී. එකී විග්‍රහයන් වලින් පැහැදිලි කරන්නේ ධනපති ක්‍රමය සංවර්ධනය නොවූ පසුගාමී හා අඩු දියුණු රටවල ධනේශ්වර සංවර්ධනය පරිපූර්ණ වශයෙන් ඉටුකර කිරීමට නොහැකි බවත්ය. මෙයට හේතු වශයෙන් මාක්ස්වාදීන් කරුණු දක්වා සිටියේ අතීතයේදී වැඩවසම්වාදය පරාජය කර දමා ධනවාදය ගොඩනැගීම සඳහා සිදුවූ ධනේශ්වර විප්ලවය මෙන් නොව මෙම රටවල ධනපති පන්තිය වැඩවසම් ක්‍රමය සමඟ එකමුතුව නිර්ධන පන්තියට එරෙහිව පෙනී සිටීමය. ඉහත ධනපති බලවේගවල ප්‍රධාන හතුරා වන්නේ නිර්ධන පතන්තිය වේ. 1848 දී යුරෝපයේ ඇති වූ පන්ති අරගල වල ස්වභාවය පැහැදිලි කරමින් කාල් මාක්ස් මෙය විග්‍රහ කරන ලදී. පසු කාලයේදී රුසියානු මාක්ස්වාදයෙකු වූ පාවුස් නොනවතින විප්ලවය පිළිබඳ කරුණු දක්වා සිටියත් එය වඩා පෝෂණය කරමින් ඉදිරි දර්ශනයක් ඉදිරිපත් කිරීමට සමත්වූයේ ලියෝන් ට්‍රොට්ස්කි විසිනි. 1917 ලෙනින් විසින් අප්‍රේල් ප්‍රවාදය ලෙස එළි දැක්වූ කෘතිය විසින්ද නොනවතින විප්ලවයේ න්‍යායික පදනම ආරක්ෂා කිරීමට කටයුතු කළේය.

**..සෝවියට් දේශයේ ඉතිහාසය පිළිබඳ නැවත කියවන්නේ නම් ට්‍රොට්ස්කි ලියා ඇති කෘතීන් ගැඹුරින් අධ්‍යනය කිරීම අවශ්‍ය වේ. මෙයින් ගම්‍යවන්නේ 20 වන සියවසේ ශ්‍රේෂ්ඨතම දේශපාලන ලේඛකයන් අතරට ට්‍රොට්ස්කි එක් වී සිටින බවයි. නමුත් ලෙනින්ගේ මරණයෙන් පසු රුසියාව තුළ බලයට පත්වූ ජෝසප් ස්ටැලින්ගේ නිලධාරිවාදී ආඥාදායකත්වය යටතේ නොනවතින විප්ලවය වෙනුවට තනි රටේ සමාජවාදය යන නිර්මාක්ස්වාදී න්‍යාය ක්‍රියාවට නැගුවේය. මෙම මගින් අධිරාජ්‍යවාදී බලවේග සමඟ සම්මුති ගොඩනගා ගැනීමට කටයුතු කළේය. ඒ සමගම ජාත්‍යන්තර පරිමානව විප්ලවවාදී බලවේග පාවාදිමට එරෙහිව කටයුතු කරන ලදී..**

මේ වන විට ජාත්‍යන්තර පරිමාන ඇති වී තිබෙන ගෝලීය ධනවාදයේ ව්‍යුහාත්මක වෙනස්කම් හේතු කොටගෙන සමහර රටවල ධනපති පාලකයින් ප්‍රජාතන්ත්‍රවාදී කර්තව්‍යන් ඉටු කිරීම දක්නට හැකි විණ. ජපානය, කොරියාව වැනි රටවල අධිරාජ්‍යවාදින්ගේ මැදිහත්වීම්වලින් බරපතල ඉඩම් ප්‍රතිසංස්කරණය සිදු කරන ලදී. ඒත් ලංකාව වැනි රටවල ධනපති පන්තියට එවැන්නක් සාර්ථක කර ගැනිමට තවමත් නොහැකි වී තිබේ. තවමත් පසුගාමී ධනේශ්වර රටක් ලෙස ලංකාව දක්නට ලැබේ. මේ දේශපාලනය හරිහැටි තේරුම් කර ගැනිමට නොනවතින විප්ලවය පිළිබඳ න්‍යායික විග්‍රහය නැවත කියවා ගැනිමට අවශ්‍ය වේ. නොනවතින විප්ලවය නිවැරදි ලෙස අධ්‍යනය කිරීමේදී ජාතික සිමාවන් මත පිහිටා බලය ලබා ගැනීමට නොහැකි බව වඩාත් සනාථ වේ.

ජාත්‍යන්තර පරිමානව මතුවන දේශපාලන දිග හැරීම් මත පමනක් විප්ලවකාරී පරිවර්ථනයක් ඇතිකර ගත හැකි බවට කරන ඉගැන්වීම් නැවත නැවතත් නිවැරදි බව ඔප්පු වී තිබේ. එවන් තත්වයක් තුළ වුවත් තනි රටක් තුළ සමාජවාදී විප්ලවය සාර්ථක කර ගැනීමට හැකිද යන ප්‍රශ්නයට ට්‍රොට්ස්කි එය කළ හැකියැයි පිළිතුරු දුනි. ලෙනින් ප්‍රකාශ කළේ අධිරාජ්‍ය වාදී දම්වැලේ දුර්වලම පුරුක බිඳ වැටුණු බවයි. එය පරාජය කිරීමට කටයුතු කරන අධිරාජ්‍යවාදි බලවේගවලට එරෙහිව එම රටවල කම්කරු පන්තිය ඇතුළු සෙසු පිඩිත බලවේග පෙරට පැමිණි යුතුයැයි අවධාරණය කළේය. මෙහිදී ලෙනින් පෙන්වා දුන්නේ රුසියානු විප්ලවයේ ජයග්‍රහණය තහවුරු කර ගැනිමට හැකි වන්නේ ජර්මනිය වැනි දියුණු ධනවාදී රටක නිර්ධන පන්තිය බලය අත්පත් කර ගැනිමෙන් පමණක් බව වැඩි දුරටත් පෙන්වා දුන්නේය. රුසියානු නිර්ධන පන්තියට ඒ මගින් බලගතු ආරක්ෂාවක් ලැබෙන බව කියා සිටියේය.

සෝවියට් දේශයේ ඉතිහාසය පිළිබඳ නැවත කියවන්නේ නම් ට්‍රොට්ස්කි ලියා ඇති කෘතීන් ගැඹුරින් අධ්‍යනය කිරිම අවශ්‍ය වේ. මෙයින් ගම්‍යවන්නේ 20 වන සියවසේ ශ්‍රේෂ්ඨතම දේශපාලන ලේඛකයන් අතරට ට්‍රොට්ස්කි එක් වී සිටින බවයි. නමුත් ලෙනින්ගේ මරණයෙන් පසු රුසියාව තුළ බලයට පත්වූ ජෝසප් ස්ටැලින්ගේ නිලධාරිවාදි ආඥාදායකත්වය යටතේ නොනවතින විප්ලවය වෙනුවට තනි රටේ සමාජවාදය යන නිර්මාක්ස්වාදි න්‍යාය ක්‍රියාවට නැගුවේය. මෙම මගින් අධිරාජ්‍යවාදී බලවේග සමඟ සම්මුති ගොඩනගා ගැනීමට කටයුතු කළේය. ඒ සමගම ජාත්‍යන්තර පරිමානව විප්ලවවාදී බලවේග පාවාදිමට එරෙහිව කටයුතු කරන ලදී. බොහෝ රටවල කොමියුනිට් පක්ෂ සෝවියට් දේශයේ අනුගාමිකයන් බවට පත්විය. මෙකී තත්වයට එරෙහිව පෙනිසිටි සිය දහස් ගණන් සයිබිරියාවේ සිර කඳවුරවල ගාල් කරමින් විශාල පිරිසක් ඝතනය කරමින් රටින් පිටුවහල් කිරීමට ස්ටැලින්වාදි නිලධරය කටයුතු කළේය. මෙහි අවසානය වූයේ මෙක්සිකෝවේදී ට්‍රොට්ස්කි ඝතනය කර දැමීමය.

ට්‍රොට්ස්කි ඝතනය කිරීමට පෙර ඔහු උපකල්පනය කළේ සෝවියට් දේශයේ ගොඩනැගෙන නිලධාරි යාන්ත්‍රණය කම්කරු පන්තිය විසින් දේශපාලන විප්ලවකාරි නැගිටීම් මතින් පරාජය කිරීමට කටයුතු කරනු ඇතැයි කියාය. ට්‍රොට්ස්කිගේ මෙම දේශපාලන උපකල්පනය එසේ ඉටු වූයේ නොමැත. එම සමාජ පසුබිම තුළ ඇති වු සමාජ අර්බුදය නිසා දෙවන ලෝක යුද්ධයට මෙම රටවල්වලට මුහුණ දීමට සිදුවීම නිසා යුරෝපයේ බොහෝ රටවල සොවියට් හිතවාදී රාජ්‍ය පද්ධතියක් ඇතිවන ලදි. මෙමගින් සෝවියට් නිලධාරී පාලනය යම් ප්‍රමාණයකට ශක්තිමත් විය. මේ තුළ ඇති වූ අධිරාජ්‍යවාදී බලපෑම්වල පීඩනය නිසා නිලධාරි යාන්ත්‍රණයේ බෙදීම් හා අභ්‍යන්තර ප්‍රතිවිරෝධතාවයන් ඇති වෙමින් 1990 දශකයේ බරපතල ලෙස සෝවියට් දේශය කඩාවැටීමට ලක්විය. එකී තත්ත්වය තුළ නිරෝගී කම්කරු රාජ්‍යයක් ඇතිවීම වෙනුවට සිදුවූයේ ධනේශ්වර ක්‍රමය ස්ථාපිත වෙමින් ප්‍රති විප්ලවකාරී තත්ත්වයක් නිර්මාණය වීමය. එම ඇති වු සිදුවීම් වලින් ට්‍රොස්කිගේ දේශපාලන පෙරදැකීම් ප්‍රතික්ෂේප වුයේ නොමැත.

ඉතිහාසයේ අන් කවරදාකටත් වඩා මේ වන විට ගෝලීය ධනපති ක්‍රමය මුහුණදෙන අර්බුදය තීව්‍ර වී තිබේ. සමස්ථ මානව සංහතිය මේ නිසා බරපතල මරණීය අනතුරකට ඇඳ දමා ඇත. මේ තත්ත්වය තුළ ජාත්‍යාන්තර පරිමානව මානව සංහතියේ පැවැත්ව ආරක්ෂා කරගත හැක්කේ ගැඹුරු සමාජ පරිවර්තනයකට මගපාදා ගැනීමෙන් පමණි. ඒ සඳහා නිර්ධන පන්ති බලයක් ස්ථාපිත කර ගනිමින් ධනේශ්වර ව්‍යුහය විනශ කරමින් නිර්ධන පන්තියේ ප්‍රජාතන්ත්‍රවාදය තහවුරුකර ගත යුතුය.■

බී.ඒ.පී අල්විස්

අසනි
සමාජවාදී එක්සත් ලංකාවක් උදෙසා පළවන පුවත් පත

495, මාකොළ උතුර, මාකොළ.

දුරකතන: 077 9053016 / 077 7035167
වෙබ්: https://asanivoice.org

# "මහයහම් ඉරුනූරු..!"

අද අසනි කතුවැකිය තරමක කුතුහලය දනවන කතුවැකි සිරසක් සමග එළිදකියි.
එහෙත් මේ කථාන්තරයට අළුත් බවක් ඇත්තේම නැත. පසුගිය අගෝස්තු 23දාට අවුරුදු දෙසීයකට පෙරාතුව දකුණු ඉන්දියාවේ සිට මෙරටට කැන්දන් ආ වඩාත් සුදුසු වචනය නම් ''දක්කන් ආ" විය යුතුය. වතුකම්කරු ජනයා අදත් එදා මෙන්ම වහල්බවේ පත්ළටම වැටි සිටින, මෙරට හා එදා විදේශීය ධනවතුන් ගේ වහලුන් ලෙස ශ්‍රමය පුදකරනා දරිද්‍රතාවයේ දැඩි පීඩාවට පත් පිරිසකි. තමන්ගේ ලෙයින්, මසින් පෝෂණය වුව ද ඔවුන් සරුකරන බිමේ අඟලකුදු උනට හිමි නැත ඉන්නට හිටින්නට හරි හමන් හෙවනක් ද නැත. ලයින් කාමර නමින් හිරකුටි වල රඳවා දිරාගිය වහළ ,කැඩුනු බිත්ති උන් හිස මත කඩා වැටෙන්නට සලස්වා ඇත. අනේකවිධ කම්කටොළු ගෙවෙන ජීවිත වලට විසඳුම් දෙන්නට පාලකයින් සූදානම් නැත. පාලකයින්ට දරදිය අදින කම්කරු නායකයින් සමග මෙරට ධනපති සුරසැප විඳිති. දිනකට රුː 1000/ක වැටුපටත් කෙතරම් අරගල කළෝද?ඒ සොච්චම දෙන්නටත් දහසක් කොන්දේසි පැනවීය. බිමේ අයිතිය තබා මේ අසරණයන්ගේ මූලික අයිතීන්වත්ලබා දෙන්නට එකදු පාලකයෙකුත් සූදානම් නැති. ඡන්ද මැෂිමට පමණක් 'ගරු' වන ජීවිත ගැන තම නියෝජිතයන්ට වගේ වගක් නැත.

ඉතින් ....!

මේ වියැකෙන ජීවිත මෙවර හර්තාල් සමරුවෙදිවත් අරගලයේ දිසානතිය සොයාබලන්න හැකිවිනිද?
වතුකරයේ දරුවන්ගේ අධ්‍යාපන අයිතිය නාමිකව පමණකි. බහුතරයක් පාසල් අඩු පාඩුවකින් පිරුණු ගවගාල් වැනිය.මේ කම්කරු දරුවන්ගේ අනාගතය තේ දල්ලට වියළී යාවිද? අනාගත අස්ථිර ජීවිත බැලමෙහෙකම් වලට හෝටල්වල පිඟන් සෝදන්නට පමණද?
කම්කරු දැතින් වැඩන බිමේ අයිතිය අවුරුදු දෙසීයක් පුරාරැකි ජනයාගේ භුක්තියට සවිවිම අපේ අභිප්‍රායයි.
ඔවුන් සැබෑ ව්‍යවසායකයින් බවට පත් කළ යුතුය. ඉන් මෙපිට පිළිසරණක් පෙනන මානයක නොවේ.
අපි එක හඬින් මෙසේ කියමු.

වතුකරයේ අයිතිය දෙසිය වසරක් පුරා රකින වතුකම්කරු ජනයා සතු විය යුත්තේය..
උනට මූලික අයිතිවාසිකම් දිය යුත්තේය...
එම දරුවන්ගේ අධ්‍යාපන අයිතිය තහවුරු කළ යුත්තේය...

**"අසනි" ඒ අයිතිය දිනාගැනීමට කැපවෙයි..!**

## නාමල්ට ඔටුනු පැළඳවීමේ සිහිනය
# රාජපක්ෂලාගේ මළගම ඉක්මන් කිරීමක්..!

මහින්ද රාජපක්ෂගේ උරුමය පාවිච්චි කරමින් නාමල් රාජපක්ෂ ඉදිරි ජනාධිපති අපේක්ෂකයා බවට පත් කිරීමට පොහොට්ටු නායකයින් පිරිසක් ජනතා අනුමැතිය ගැනීමේ උත්සහයක නියලිසිටී. නාමල් රාජපක්ෂ නමැති මහින්ද රාජපක්ෂගේ පුත්‍රරත්නය පිළබිඳ පොහොට්ටුවේ හිතවාදීන් අතරද අනුමැතියක් ලබා ගැනීම පහසු නොමැති බව පෙනේ. මහින්ද ජනාධිපතිවරයා බවට පත්වී සිටි කාලයේ ඔහුගේ බල මහිමයෙන් වැජඹීමට නාමල් කටයුතු කිරීම නිසා රාජපක්ෂ හිතවාදීන් අතරද තිබුනේ අප්‍රසාදයකි. මේ නිසා නාමල්ගේ ක්‍රියාවන් රට ඉදිරියේ නිරන්තර කතා බහට ලක්විය. මැතිවරණයේදී නාමල් වේදිකාවට එන විට අසුන්වලින් නැගිට සියලුදෙනා ආචාර කළයුතුව තිබේ. එක් අවස්ථාවක වැඩිහිටි ඇමතිවරයෙක් එසේ නොකිරීම නිසා නාමල් වේදිකාවේ සිටම එම ඇමතිවරයා ලඟට පැමිණ මොකද කොන්ද පනනැතිදැයි විමසා ඇත. මෙවැනි විවිධ කතා බහ නිසා පොහොට්ටු හිතවාදීන් අතරද නාමල්ට තිබෙන්නේ අප්‍රසාදයකි. මෙම තත්ත්වය තුළ කුමන අපේක්ෂකයා පොහොට්ටුවෙන් ඉදිරිපත් කරනු ලැබුවත් රාජපක්ෂලාගේ මළගම වැළැක්වීමට නොහැකි වේ.■

## බඩුවල මිල වැඩි වුනාට
# උද්ධමනය අඩු වෙලාලූ..!

පසුගිය මාසයේ ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තු වාර්තා අනුව ප්‍රකාශ වුයේ උද්ධමනය අඩුවී ඇති බවයි. මේ එළිදැක්වූ වාර්තා එසේ වුවත් ආහාර ද්‍රව්‍යවල නම් කිසිදු අඩුවීමක් දකින්නට නොමැත. මේ අතර වෙළඳ ව්‍යාපාරකයින් කියා සිටින්නේ ද තම ආර්ථික තත්ත්වය සීඝ්‍රයෙන් පහල වැටී ඇති බවය. ක්‍රෙඩිට්කාඩ් පාවිච්චි කරන අය කියා සිටින්නේ තමන්ගේ ණය ගෙවාගන්නටත් ඔවුන්ට නොහැකි වී ඇති බවය. ඒ සඳහා තිබෙන ඉල්ලුම පහත වැටීම මෙයට හේතුව වේ.■

# EPF-ETF
# සටන දිගටම..!




දේශීය ණය ප්‍රශස්තකරණය කිරීමේදී අර්ථසාධක අරමුදල ඇතුළු සේවක අරමුදල්වලට බලපෑම් කිරීමට ආණ්ඩුව ක්‍රියා කරමින් තිබෙනවා. මෙලෙස ණය මුදල් ලබා ගෙන ණය ප්‍රතිව්‍යුහගතකරණය කිරීම වැඩ කරන ජනතාවගේ මූලික අයිතිවාසිකම් පැහැර ගැනීමක් වෙනවා. පාලකයින්ගේ මෙම අත්තනෝමතික ක්‍රියාවන්ට එරෙහිව දැවැන්ත සටන් ක්‍රියාකාරීත්වයට මුල පිරීමට වැඩ කරන ජනතාව දැනටමත් තීන්දු කර ඇති අතර රනිල් වික්‍රමසිංහ ඇතුළු පොහොට්ටු පාලකයන් පන්නා දැමීම දක්වා මෙම විරෝධය අඛණ්ඩව ඉදිරියට ගෙන යා යුතු බව තින්දු කර තිබෙනවා.■

53 හර්තාලය .. 2 පිටුවෙන්

වී ඇත. ඔවුන් පාලයන් සමඟ නොනැවතින අරගලයකට පිවිසීම කාලය පිළිබඳ ප්‍රශ්නයක් පමණි.
වත්මන් අර්බුදයෙන් ගොඩ ඒමට රනිල් රාජපක්ෂ පාලනය අනුගමනය කරන උත්සහය අසාර්ථක බව මේ වන විට පැහැදිලි වෙමින් තිබේ. මැදපංති බලවේග සන්තර්පනය කිරීමට ඔවුන් ගනු ලබන උත්සහයට අනාගතයක් නැත. මේ තත්වය තුළ අරගලයේ දෙවන අදියර ලෙස සැලකිය හැකි මෙම අවදියේ ප්‍රධානතම සටන් කරුවන් බවට පත්වන්නේ කම්කරුවන්, ධීවරයන් ඇතුලු ගොවි ජනතා ප්‍රමුඛ සමස්ත පීඩිත සමාජ බලවේග වේ. කුස ගින්නට එරෙහිව මතුවන සටන පංති අරගලයේ තියුණු අවස්ථාවක් වනු නිසැකය. ඊළඟ අරගලය බඩගින්නට එරෙහි පීඩිත ජන කොටස් වලින් පැන නගින එකක් වන හෙයින් එය ලේසියෙන් නැවැත්විය හැකි එකක් නොවනු ඇත. මේ ගැඹුරු අර්බුදය තුළ මතුවන අරගළයට නිවැරදි නායකත්වයක් ලබාදීමට බරපතළ අභියෝගයකි. මේ සඳහා වැඩකරන ජනතාව ප්‍රමුඛ පීඩිත බලවේග අතර ගැඹුරු ප්‍රජාතන්ත්‍රවාදි කථිකාවතට මුල පිරීම අවශ්‍ය වේ.
මහින්ද දේවගේ ■

## ඇදුරු හැවිල්ල

### ඵත් අනේ...!

උද්ධමනය හරි වේගෙන් පහළ ගෙනල්ලලු
දැන් එය තනි ඉලක්කමක් වෙතට ගෙනල්ලලූ

ඵත් අනේ...!

ජහමනයට කිසිත් දැනෙන් නැති
බඩුමිළ අද රොකට් එකෙන් හඳට ගිහින් නොවැ

ඵත් අනේ..!

සයුරෙන් මට කොදෙව්වේ මාළු ගණන් ගියෝ
මස් බිත්තර අහස් ඉමේ වළා පොවේ.

ඵත් අනේ...!

කොහොමින් හරි දුප්පතාගේ හැඹිලියටහ් සාගතේ
බැංකු ගිලපු උන්ට සකෝ හැඹිලිය මොන කජ්ජක් වෙද?

ඇහැළියගොඩ, අඟරුවාමුල්ල, පදිංචි දේව මහින්දදාස වන මා විසින් ඇහැළියගොඩ, මිහිඳු ග්‍රැෆික්ස් ආයතනයේ මුද්‍රණය කරන ලදි.